# දිය අගල්, වැව් හා ළිං ඉදිකිරීමේ පුරාණ තාක්ෂණය: විශ්වකර්ම වාස්තුශාස්ත්‍රය ඇසුරෙන් කෙරෙන විමසුමක්

**ජම්බුගහපිටියේ ධම්මාලෝක හිමි**

කථිකාචාර්ය, සම්භාව්‍ය භාෂා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.
gahapitiyajambu@gmail.com / 071 448 8975

## හැඳින්වීම

දිය අගල්, වැව් හා ළිං ඉදිකිරීම මිනිසා විසින් අරඹන ලද්දේ කවර කලෙක දැයි නිශ්චිත ව කිව නොහැකි නමුත් ඉතා ඈත අතීතයක සිට ම ඔවුන් විසින් එ වැනි ඉදිකිරීම් කරන ලද බවට සාක්ෂ්‍යයන් විශාල ප්‍රමාණයක් ශේෂ වී තිබේ. ඉතා පැරණි සාහිත්‍යයක් ලෙස සැලකෙන ත්‍රිපිටකයේ ද ඊටත් පෙර රචිත යැයි සැලකෙන බ්‍රාහ්මණ ආදි ග්‍රන්ථවල ද පොකුණු හා ළිං පිළිබඳව සඳහන් වේ. අනෙක් අතට එදා සෑම ආරාමයක ම පොකුණක් තිබීම අනිවාර්ය කරුණක් සේ සැලකූ බව ද පෙනේ. එයට අමතර ව නගරවල ද මහජනයා ගැවසෙන ස්ථානවල ද කිසියම් ජලාශයක් ඉදිකිරීම සිරිතක් ව තිබී ඇත. කෙ සේ හෝ මුල දී සරල මට්ටමක පැවති ජලාශ ඉදිකිරීම පසුව ක්‍රමයෙන් සංකීර්ණ වෙමින් අතිශයින් දියුණු තාක්ෂණික ක්‍රමවේදයක් බවට පත් වී ඇත. තවදුරටත් දියුණු වූ එය විධිමත් වාස්තුවිද්‍යාත්මක දැනුමක් ඇති ව කිසියම් නිශ්චිත ක්‍රමවේදයකට අනුව ඉදිකරන්නක් බවට පත් වි ය. මේ නිසා ම ගෘහ නිර්මාණය, ආරාම නිර්මාණය, පිළිම ඉදිකිරීම, සිතුවම් ඇඳීම වැනි තාක්ෂණික කරුණු ඇතුළත් කොට රචනා කර ඇති ශිල්ප ග්‍රන්ථයන්හි ජලාශ ඉදිකිරීමට අදාළ කරුණු ද නියතයෙන් ම ඇතුළත් කර තිබේ.

ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථ මුළුමනින් ම සංස්කෘත භාෂාවෙන් රචනා වූ සාහිත්‍ය විශේෂයකි. ශිල්ප යන්නෙන් වාස්තුවිද්‍යාව, ප්‍රතිමාකරණය හා සිතුවම්කරණය යන විෂයයන් ත්‍රිත්වය ම අදහස් කරනු ලැබේ. මුල් යුගයේ දී මෙම විෂයයන් එක ම විෂයයක් වශයෙන් පැවති හෙයින් 'ශිල්ප' යන නමින් වෙසෙසා ඇති නමුත් ඒවා දියුණු වී හුදකලා විෂයයන් වශයෙන් වැඩෙන විට ඒ ඒ විෂයයන්ගේ නමින් හඳුන්වා ඇත. මෙම සාහිත්‍යාංගයට අයත් බොහෝ පොත් ප්‍රමාණයක් දකුණු ඉන්දියාවේ දී ද ලංකාවේ දී ද සංස්කෘත භාෂාවෙන් රචනා වී ඇත. මානසාර, මයමත, ශිල්පරත්න, විශ්වකර්ම වාස්තු ශාස්ත්‍ර ආදි කෘති ඉන්දියාවෙහි ද මඤ්ජුශ්‍රීභාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර, ශාරිපුත්‍ර, රූපමාලා, වෛජයන්ත තන්ත්‍රය ආදි කෘති ලංකාවෙහි ද රචනා වී තිබේ. මෙම කෘති පොදුවේ ගත් විට පාංශු පරීක්ෂාවේ පටන් නගර නිර්මාණය දක්වා සිදුකෙරෙන ඉදිකිරීම් සඳහා අවශ්‍ය සියලු මගපෙන්වීම් සිදුකරයි. එම වාස්තුවිද්‍යාත්මක ග්‍රන්ථයන් ඇසුරින් දිය අගල්, වැව් හා ළිං ඉදිකිරීමේ තාක්ෂණය පිළිබඳ ව හැදෑරීමට මෙහි දී අපේක්ෂා කරනු ලැබේ.

## පර්යේෂණ ගැටලුව

පෞරාණික වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් වන දිය අගල්, වැව් හා ළිං තැනීම සඳහා ඊට ආවේණික තාක්ෂණික ඥානයක් පවතින බැව් මෙ තෙක් සිදුකෙරී ඇති පුරාවිද්‍යාත්මක පර්යේෂණවලින් තහවුරු වී තිබේ. මෙහි දී විමසීමට බඳුන් කරනුයේ ඒ පිළිබඳ සංස්කෘත ශිල්පග්‍රන්ථයන්ගෙන් හෙළි වන තාක්ෂණය කවරේ ද? ඊට විධිමත් ශාස්ත්‍රී සම්ප්‍රදායයක් පවතී ද? යන්නයි.

## ක්‍රමවේදය

මෙහි දී සාකච්ඡාවට බඳුන් කෙරෙනුයේ ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයන්හි නිර්දිෂ්ට ළිං,

පොකුණු ආදිය ඉදිකිරීමේ තාක්‍ෂණය පිළිබඳවයි. මෙය සපුරා ම සාහිත්‍ය අධ්‍යයනය මත පිහිටා ඇති පර්යේෂණයකි. මූලික වශයෙන් ඉන්දියාවේ රචිත සංස්කෘත ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයන් ද ශ්‍රී ලාංකේය ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථයන් ද ඇසුරු කරනු ලබන අතර ප්‍රධාන මූලාශ්‍රයය වන්නේ විශ්වකර්මවාස්තු ශාස්ත්‍රයයි. මේ කෘතියෙහි දැක්වෙන කරුණු සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීමත් ඊට අදාළ ව අනෙකුත් මූලාශ්‍රයයන්හි ඇති කරුණු අවශ්‍යතාවන් අනුව භාවිත කිරීමත් සිදු වේ.

**සාකච්ඡාව**

විශ්වකර්ම වාස්තුශාස්ත්‍රයෙහි 33 වැනි පරිච්ඡේදයේ දිය අගල්, වැව් හා ළිං ඉදිකිරීමට අදාළ තොරතුරු ඉදිරිපත් කර තිබේ. මේ නිසා ම එහි එම පරිච්ඡේදය හඳුන්වා ඇත්තේ 'වාපිකූපලක්‍ෂණකථන' යනුවෙනි.

විශ්වකර්ම වාස්තුශාස්ත්‍රයේ වැව් (වාපි) යනුවෙන් හඳුන්වා ඇත්තේ වැව් නොව උද්‍යාන අලංකරණය සඳහා ස්වාභාවික ජල මූලාශ්‍රයයන් ආශ්‍රයෙන් ඉදිකළ අමුණු වැනි ජලාශ විශේෂයක් බව පෙනෙයි. මේ ඉදිකරන ජලාශයන් තුන අතරින් දිය අගල විශාලතම ජලාශය බැව් දක්වා තිබීමෙන් ද එය තහවුරු වේ. කවරක් වුව ද මෙවන් ඉදිකිරීමක දී ග්‍රීෂ්ම ඍතුවේ දී පවා නිරන්තරයෙන් ජලය පවතින ජල මූලාශ්‍රයක් භාවිත කළ යුතු බව එය පෙන්වා දෙයි. එ මෙන් ම ඉදිකිරීම කුමක් වුව ද එම භූමිය දෝෂයන්ගෙන් තොර වූවක් විය යුතු ය. සාමාන්‍යයෙන් කවර ඉදිකිරීමකට හෝ පෙර භූමි පරීක්‍ෂාව වාස්තුවිද්‍යාවේ ක්‍රමයයි. මෙහි දී ද එහි බලපෑම පෙනෙන අතර එම භූමිය හුණු ගල්, ශක්තිමත් නොවූ ගල් වර්ග, සත්ත්ව අස්ථි කොටස්, කපාල වැනි දෙයින් තොර බිමක් විය යුතු ය. එසේ භූමිය තෝරාගැනීමෙන් පසු ඉදිකිරීම ආරම්භ කළ හැකි වේ. එහෙත් එහි දී වාස්තුවේ ප්‍රමාණය සාමාන්‍ය නිවසක් සඳහා නම් තරමක් කුඩාවට ද රාජ මන්දිරයක් හෝ මහා ධනවතෙකුගේ නිවසක් සඳහා නම් විශාල ව ද ගැනීම සුදුසු බව නිර්දේශයයි. ළිං තැනීමේ දී එය චතුරශ්‍රාකාර අයුරින් හෝ වෘත්තාකාර අයුරින් ඉදිකළ හැකි නමුත් දිය අගල් හා වැව් චතුරශ්‍රාකාරයෙන් ම ඉදිකිරීම යෝග්‍ය බව නිර්දේශයයි. මේ පිළිබඳ මිනුම් දක්වන වාස්තුශාස්ත්‍රය පළල අවම වශයෙන් දණ්ඩ 3ක් ද උපරිම වශයෙන් දණ්ඩ 10ක් ද විය යුතු බව කියයි. (දණ්ඩ යනු දිග මැනීමේ ඒකකයක් වන අතර එය රියන් 4කට සමාන වේ.) දිග සුදුසු පරිදි ගැනීමට නිදහස ලබා දී තිබෙන නමුත් ගැඹුර අවම වශයෙන් රියන් 10ක් විය යුතු ය. නියමය මෙ සේ වුව ද පළපුරුදු වාස්තුශාස්ත්‍රඥයෙකුට භූමියේ ප්‍රමාණය, හැඩය හා පසේ තත්ත්වය අනුව මිනුම් මෙන් ම හැඩය ද සුදුසු පරිදි යෙදීමට නිදහස දී තිබේ. වේල්ල ඉදිකිරීමේ දී ගලා එන ජලයට මුහුණ දෙන පැත්තේ බිත්තිය පිළිබඳ ව විශේෂ සැලකිල්ලක් දක්වා තිබේ. එය දැඩි ව ඉදිකළ යුතු අතර ඒ සඳහා ඝන පාෂාණ විශේෂ, මැනවින් පිළිස්සුණු ගඩොළු හා නියමිත අනුපාතයට හුණු එක්කරන ලද බදාම භාවිත කළ යුතු ය. මැලියම් භාවිතයෙන් බන්ධනය තවදුරටත් දැඩි කළ යුතුය. අවාසනාවකට මෙන් ඒ සඳහා භාවිත කළ යුතු මැලියම් පිළිබඳ විස්තරයක් කෘතියෙහි ඇතුළත් ව නොමැත.

භාරතීය වාස්තුශාස්ත්‍රය සෑම විට ම සෞන්දර්යය හා බැඳී පවතී. මෙම ලක්‍ෂණය වැව්, ළිං ඉදිකිරීමේ දී ද දක්නට ලැබෙන අතර එය ජලාශයන් සමීපයේ අංගණ (සමතලා භූමි ප්‍රදේශ/මිදුල්) ඉදිකිරීමට උපදෙස් සපයයි. විශේෂයෙන් රාජෝද්‍යානවල වාස්තු ඉදිකළ අවස්ථාවල දී රජවරුන්ගේ විනෝදය සඳහා එවන් භූමි පිළිවෙළින් උස වැඩිවන අයුරින් සතරක් දක්වා ඉදිකළ යුතු අතර ඒවායෙහි ස්තම්භ පිහිටුවා ඒවා ඇසුරින් මණ්ඩපයන් ද සැකසිය යුතු ය. මේවා වර්ෂා කාලයේ දී අතිශයින් ප්‍රයෝජනවත් වන අතර වැසි නොමැති කාලවල දී ජලක්‍රීඩා ආදිය සඳහා ද උපයෝගී කරගෙන තිබේ. එක් එක් අංගණයක සිට සමාසන්න අංගණයට පිවිසීම සඳහා අලංකරණය කරන ලද සෝපානයන් යෙදිය යුතු ය. එ මෙන් ම සුදුසු ස්ථානයන්හි දේව හා දේවතා පිළිම හෝ වෙනත් පිළිම ස්ථාපනය කිරීමටත් විවිධ සැරසිලිවලින් අලංකාර කිරීමටත් ඝටී යන්ත්‍රය (ජලයෙන් ක්‍රියාකරන යන්ත්‍ර විශේෂයක්/ජලයෙන් ක්‍රියාකරන ඔරලෝසුවක්) යෙදීමටත් එය නිර්දේශ කර තිබේ.

මෙම කරුණු අනුව ඉතා විධිමත් වාස්තුශාස්ත්‍රීය ඥානයක් පෙරදිග ලෝකයට හිමි වී තිබූ බව පැහැදිලි වන අතර දැනට ශේෂ වී ඇති නටබුන්වලින් පවා ඒ බැව්

මනාව තහුවරු වේ. එම දැනුම බොහෝ සෙයින් සංස්කෘත ශිල්පශාස්ත්‍ර සාහිත්‍යයෙහි ඇතුළත් ව පවතියි. එකී ග්‍රන්ථයන්හි දැක්වෙන නිර්දේශයන් දැනට කර ඇති ඉදිකිරීම් හා සසඳ බැලීමෙන් ඒවා ප්‍රායෝගික ව භාවිත කර ඇත්තේ කෙ සේ දැයි අවබෝධ කරගැනීමට හැකියාව ලැබේ. එ මෙන් ම ඒවා හුදෙක් නිර්මාණකරුගේ හෝ ඉදිකරවන්නාගේ අවශ්‍යතාව මත සැලසුම් වූවා නොව කිසියම් ශාස්ත්‍රීය සම්ප්‍රදායයක් ඇසුරින් නිර්මාණය වී ඇති බව මෙම කෘති පරිශීලනයෙන් පෙනීයයි. පැරැන්නෝ සතු ව විශිෂ්ට තාක්ෂණික ඥානයක් ද එය පරපුරෙන් පරපුරට විධිමත් ව පවත්වාගෙන යෑමේ විධිමත් ක්‍රමවේදයක් ද පැවති බව සංස්කෘත ශිල්පශාස්ත්‍ර සාහිත්‍ය මගින් අනාවරණය වේ.

### ආශ්‍රිත ග්‍රන්ථ


A Dictionary of Hindu Architecture, (1995) (ed.) Prasanna Kumara Acarya, Munshiram Manoharlal Publishers Pvt Ltd., New Delhi.

Architecture of Mānasāra, (2011) (ed.) S. Jain, New Bharatiya Book Corporation, Delhi.

Shukla, D.N., (1960) Vāstu-Śāstra, Vol. I, Vāstu VāE maya Prakāśana Śālā, Lucknow.

Viśvakarma Vāstuśāstram, (1958) (ed.) K. Vāsudeva Sāstri & N.B. Gadre, Sri S. Gopalan, Tanjore.